# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 අප්‍රේල්/ මැයි

**මානවශාස්ත්‍ර පීඨය**

**ප්‍රාසංගික කලා (නව / පැරණි නිර්දේශය)**

**ප්‍රාසංගික කලා ප්‍රවේශය - PART E 1015**

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. දේශීය යාතුකර්මයන්හි විද්‍යාමාන ප්‍රාසංගික ලක්ෂණ ඔබ කැමති එක් යාතුකර්මයක් ඇසුරෙන් නිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

02. ප්‍රාසංගික කලා "සාමූහික කලා" (Collective Art) යනුවෙන් හැඳින්වෙනුයේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

03. ලොව අතිවිශිෂ්ට ප්‍රාසංගික කලා නිර්මාණවල සාර්ථකත්වය උදෙසා අභිවාහකයාගේ කාර්යභාරය කොතෙක්දුරට ඉවහල් වී ඇතිදැයි නිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

04. සතර අභිනය යන්න හඳුන්වා දී ප්‍රාසංගික නිර්මාණවල රස ප්‍රයුංජනය උදෙසා ආහාර්ය අභිනය කොතෙක් දුරට ඉවහල් වී ඇත්දැයි නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න.

05. "සංස්කෘතිය" යන්න නිර්වචනය කොට සංස්කෘතික අනන්‍යතාව (Cultural Identity) තීරණය කිරීමෙහි ලා මූලික වන අංග මොනවාදැයි විස්තර කරන්න.

06. ප්‍රාසංගික කලා නිර්මාණයක අර්ථ තීව්‍ර ප්‍රේක්ෂාව සඳහා රංග වින්‍යාස ශිල්පියා විසින් භාවිතයට ගනු ලබන ක්‍රමෝපාය නිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

07. ප්‍රාසංගිකත්වය තීව්‍ර කිරීමෙහිලා ආලෝකකරණය හා තාක්ෂණික ක්‍රම ශිල්පවල භාවිතය කොතෙක්දුරට ඉවහල් වී ඇත්දැයි යන්න ඔබ නැරඹූ ප්‍රාසංගික කලා කෘතියක් ඇසුරෙන් නිදසුන් සහිතව විමසන්න.

08. ප්‍රේක්ෂාව ජනනය කිරීම සඳහා සංගීත භාවිතයෙහි ඇති වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න.

09. ප්‍රාසංගික කලා නිර්මාණයක දී සංගීත අධ්‍යක්ෂවරයාගේ එම නිර්මාණයේ සාර්ථකත්වයට දායක වන්නේ කවර ආකාරයෙන්දැයි යන්න පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

*************************************